Form No. 573 S

PEOPLE'S BANK
The Bank of the People

# ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත
## ස්ථාවර තැන්පතු
(තනි පුද්ගල/බද්ධ)

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි | | | |
|---|---|---|---|
| ගිණුම් අංකය | | | |
| CIF අංක 1 | | | |
| CIF අංක 2 | | | |
| තොරතුරු ඇතුළත් කරන ලද්දේ, නම හා සේවා අංකය | බලයලත් නිලධාරී අත්සන හා සේවා අංකය | කළමනාකාර අත්සන හා සේවා අංකය | |
| | | | |
| කුවිතාන්සි අංකය | | | |
| ගනුදෙනු අංකය | | | |

දිනය

කළමනාකරු, මහජන බැංකුව

.......................................................................................................... ශාඛාව

කරුණාකර පහතින් ලබා දී ඇති තොරතුරුවලට අනුව සහ බැංකුවේ නීති හා රෙගුලාසිවලට යටත්ව ස්ථාවර තැන්පතු ගිණුමක් / නිවේදනීය තැන්පතු ගිණුමක් විවෘත කරන්න.

| | | | |
|---|---|---|---|
| ගිණුම් වර්ගය | ස්ථාවර තැන්පත් ☐ සත්දින නිවේදන තැන්පතු ☐ | මුදල් වර්ගය : ශ්‍රී ලංකා රු. ☐ විදේශීය මුදල් ☐ | මුදල් වර්ගය සඳහන් කරන්න ........................ |
| නිමැවුම් නාමය | ඇත්නම්, (කරුණාකර සඳහන් කරන්න) ........................ | | |

## මූලික තොරතුරු

| පෞද්ගලික තොරතුරු - අයදුම්කරු 1 | පෞද්ගලික තොරතුරු - අයදුම්කරු 2 |
|---|---|
| මුලකුරු සමග නම (මයා/මිය/මෙනවිය/....................) | මුලකුරු සමග නම (මයා/මිය/මෙනවිය/....................) |
| මුලකුරු වලින් හැඳින්වෙන නම් | මුලකුරු වලින් හැඳින්වෙන නම් |
| වෙනත් නම් (ඇත්නම්) | වෙනත් නම් (ඇත්නම්) |
| උපන් දිනය / ජාතික හැඳුනුම්පත් අංකය | උපන් දිනය / ජාතික හැඳුනුම්පත් අංකය |
| රියදුරු බලපත්‍ර අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය හා නිකුත් කළ දිනය | රියදුරු බලපත්‍ර අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය හා නිකුත් කළ දිනය |
| ජාතිය/පුරවැසිභාවය | ජාතිය/පුරවැසිභාවය |
| ස්ථිර ලිපිනය | ස්ථිර ලිපිනය |
| රැකියාව/වෘත්තිය | රැකියාව/වෘත්තිය |
| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | සේවා යෝජකයාගේ නම සහ ලිපිනය |
| දුරකථන අංකය: නිවස/කාර්යාලය | දුරකථන අංකය: නිවස/කාර්යාලය |
| දුරකථන අංකය: ජංගම/විදේශීය | දුරකථන අංකය: ජංගම/විදේශීය |
| ෆැක්ස් අංකය | ෆැක්ස් අංකය |
| විද්‍යුත් තැපැල් ලිපිනය | විද්‍යුත් තැපැල් ලිපිනය |

තනි පුද්ගල ගිණුම ☐ බද්ධ ගිණුම ☐ කාලය (මාස) ☐☐ පොලී අනුපාතිකය .................. %

තැන්පත් මුදල ඉලක්කමෙන් ☐ අකුරෙන් ..........................................................

ස්වයංක්‍රීය අළුත් කිරීම: ඔව් ☐ : නැත ☐ : ඔව් නම්, පොලිය සහිතව ☐ : පොලිය රහිතව ☐ | අළුත් කිරීමේ නිවේදනය ලබා ගන්නා අයුරු (එක් විකල්පයක් තෝරන්න) : මුද්‍රිත පිටපත ☐ : විද්‍යුත් නිවේදනය කෙටි පණිවිඩය සහිත ☐ : විද්‍යුත් නිවේදනය කෙටි පණිවිඩය රහිත ☐ : කෙටි පණිවිඩ පමණි ☐

කරුණාකර පොලිය ගෙවන්න, වාර්ෂිකව ☐ මාසිකව ☐ අලුත් කිරීමේ දී ☐ බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය :

........................... බැංකුවේ ........................................ ශාඛාවේ ගිණුම් අංක ........................................ ට පොලිය බැර කරන්න.

## ගනුදෙනුකරු හඳුනා ගැනීම පිළිබඳ තොරතුරු (KYC Information)

අනිවාර්ය පරීක්ෂාව (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි) (පිළිගත හැකි පහත සඳහන් ලිපි ලේඛණ එකක් මගින් තහවුරු කරගත යුතුය)

01. නම, උපන් දිනය, ජාතිය සහ පුරවැසිභාවය තහවුරු කර ගැනීම. ☐ ජා.හැ. ☐ විදේශ ගමන් බලපත්‍රය ☐ රියදුරු බලපත්‍රය ☐ වෙනත් (කරුණාකර සඳහන් කරන්න) ..............................

02. ලිපිනය තහවුරු කර ගැනීම ☐ ජාතික හැඳුනුම්පත ☐ රියදුරු බලපත්‍රය ☐ රජයේ අධිකාරියකින් ලිපියක් ☐ වෙනත් (කරුණාකර සඳහන් කරන්න) ..............................
☐ බැංකු ප්‍රකාශන ☐ කුලී ගිවිසුම ☐ සේවා නියුක්ත ගිවිසුම
☐ තක්සේරු දැන්වීම් ☐ ආදායම් බදු කුවිතාන්සිය ☐ පාරිභෝගික බිල්පත් (කරුණාකර සඳහන් කරන්න) ..............................

අදාළ කොටුව තුළ ( ✓ ) ලකුණ යොදන්න (සැ.යු. 1: පළමු අයදුම්කරු, 2: දෙවන අයදුම්කරු)

| වර්ගීකරණය | විස්තරය | 1 | 2 | විස්තරය | 1 | 2 |
|---|---|---|---|---|---|---|
| ගනුදෙනුවේ ස්වභාවය | මුදල් | | | විද්‍යුත් මුදල් හුවමාරුව (Wire Transfer) | | |
| | චෙක්පත් | | | වෙනත් (සඳහන් කරන්න) .................... | | |
| ගිණුම් විවෘත කිරීමේ අරමුණ සහ භාවිතය | ව්‍යාපාරික | | | ඉතුරුම් / ආයෝජන | | |
| | රැකියාව / වෘත්තිය | | | පවුලට ලැබෙන ආමුඛ ප්‍රේෂණ | | |
| | ණය ගෙවීම | | | නිෂ්පාදන | | |
| | ආනයන/අපනයන | | | ආහාර සැපයුම්/ආපනශාලා | | |
| | තොග වෙළඳාම | | | වෘත්තීය ආදායම් | | |
| | සේවා කර්මාන්ත | | | සිල්ලර වෙළඳාම | | |
| | පෞද්ගලික සේවා | | | වෙනත් (සඳහන් කරන්න) .................... | | |
| අරමුදල්/ධනය ලැබෙන මූලාශ්‍ර | ව්‍යාපාරික ආදායම් | | | ආධාර / පුණ්‍යාධාර (දේශීය/විදේශීය) | | |
| | පවුලට ලැබෙන ප්‍රේෂණ | | | ව්‍යාපාර හිමිකාරීත්වය | | |
| | දේපල / වත්කම් විකුණුම් | | | උරුමයෙන් | | |
| | බැංකු පහසුකම් | | | ආයෝජන | | |
| | වෘත්තිය / රැකියාව | | | වෙනත් (සඳහන් කරන්න) .................... | | |
| | වැටුප් / ලාභ ආදායම් | | | | | |

සැලකිය යුතුයි : (අයදුම්කරුවන් දෙදෙනෙකුට වඩා වැඩි ගිණුම් සඳහා මෙයට අමතරව තවත් ගිණුම් විවෘත කිරීමේ අයදුම්පතක් භාවිතා කරන්න.)

ඔබ විදේශීය පුද්ගලයෙක්ද?

1 ☐ 2 ☐ ඔව්. මම/අපි ........................................ රටේ පුරවැසියෙක් වෙමි / පුරවැසියන් වෙමු. මාගේ / අපගේ විදේශ ගමන් බලපත්‍ර අංකය/අංකයන් ......................

1 ☐ 2 ☐ නැත. මම/අපි විදේශ රටක පුරවැසියකු නොවෙමි/පුරවැසියන් නොවෙමු. අනාගතයේදී මම/අපි විදේශ රටක පුරවැසියෙකු/පුරවැසියන් වුවහොත්, ඒ බව බැංකුව වෙත දැනුම් දීමට එකඟ වෙමි/වෙමු.

ඔබ දේශපාලනයට අනාවරණය වූ පුද්ගලයෙක්ද? ඔව් 1 ☐ 2 ☐ නැත 1 ☐ 2 ☐

ඔබ විදේශ ගිණුම් සඳහා බදු අයකිරීම් අනුකූලතා පනතේ ප්‍රතිපාදන යටතේ ඇමරිකානු පුද්ගලයෙකුද? ("FATCA") ☐ ඔව් 1 ☐ 2 ☐ ☐ නැත 1 ☐ 2 ☐

"දේශපාලනයට අනාවරණය වූ පුද්ගලයෙකු" යන්නට නිර්වචනය

ශ්‍රී ලංකාවේ හෝ විදේශයන් හි සිටින පුද්ගලයන්

- රාජ්‍ය නායකයින් හෝ ආණ්ඩුවේ ප්‍රධානීන්
- දේශපාලකයින්
- ජ්‍යෙෂ්ඨ රාජ්‍ය,අධිකරණ,හමුදා නිලධාරීන්
- රාජ්‍ය සංස්ථා, රාජ්‍ය ආයතන, ස්වායක්ත පුද්ගල/මණ්ඩලයන්හි ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්
- වැදගත් දේශපාලන පක්ෂ නිලධාරීන්,
- ඉහත සඳහන් පුද්ගලයන්ගේ සමීප ඥාතීන් සහ සමීප ඇසුරක් පවත්වන පාර්ශවයන්

"විදේශීය පුද්ගලයෙකු" යන්නට නිර්වචනය

- විදේශීය රටක පුරවැසියෙකු වෙනත් රටක පදිංචිකරුවෙකු වුවත් විදේශයකදී උපත ලබා එසේ උපත ලද රටෙහි පුරවැසිභාවය අත්නොහල පුද්ගලයින්ද ඇතුළත්ව
- විදේශීය රටක නීත්‍යානුකූල පදිංචිකරුවෙකු
- විදේශීය රටක පදිංචි වී සිටින පුද්ගලයෙකු
- වීසා කාලය මත විදේශීය රටක කිසියම් දින ගණනක් ගත කරන පුද්ගලයෙකු
- විදේශ රටක සංස්ථා, බූදල් හා භාරයන්
- විදේශීය රටක හෝ එයට අයත් බල ප්‍රදේශයකට සම්බන්ධකමක් හෝ අයිතියක් ඇති කිසියම් පුද්ගල ඒකකයක්
- "ප්‍රමාණවත් අර්ථලාභී හිමිකරුවෙකු" ලෙස සැලකිය හැකි එක් විදේශිකයෙකු හෝ ඇතුළත් කිසියම් දේශීය පුද්ගල ඒකකයක්

## කොන්දේසි සහ නියමයන්

01. ගිණුම් විවෘත කරන අවස්ථාවේදී දෙන ලද උපදෙස්වලට වෙනස් අයුරකින් තැන්පත්කරු/තැන්පත්කරුවන් විසින් තැන්පතුව බලපවත්වන්නාවූ කාලය නිමවීමට අවම වශයෙන් දින හතකට ප්‍රථම ලිඛිත උපදෙස් නිකුත් කර නොමැති නම් බැංකුවේ අභිමතය පරිදි සහ වරින් වර පනවනු ලබන කොන්දේසිවලට (පොලී අනුපාතිකයද ඇතුළත්ව) යටත්ව තැන්පත්කරුගේ උපදෙස් පරිදි පොලිය සහිතව/රහිතව ඉදිරි කාලය සඳහා ස්ථාවර තැන්පතුව අලුත් කිරීමට බැංකුවට බලය ඇත.

02. ගිවිස ගත් කාලයට ප්‍රථම තැන්පත්කරු/තැන්පත්කරුවන් විසින් තැන්පතුව ආපසු ගැනීමේ දී බැංකුව විසින් නිර්දේශිත අඩු පොලී අනුපාතිකයන් ගෙවීමටත්, සම්පූර්ණ කාල පරිච්ඡේදය සඳහා ගිවිසගෙන ඇති මාසික පොලී ලබන තැන්පත්, තැන්පත් කාලය අවසන්වීමට ප්‍රථම ආපසු ගන්නා විට වැඩිපුර ලබාගෙන ඇති පොලිය, මුල් මුදලින් හෝ එම අවස්ථාවේ ගෙවීමට ඉතිරිව ඇති පොලී ශේෂයකින් අයකර ගැනීමටත් බැංකුවට අයිතිය ඇත.

03. බද්ධ ගිණුම්කරුවන්ගෙන් එක් අයෙකු මියගිය විට ජීවත්ව සිටින්නාට/සිටින්නන්ට එම තැන්පතුව පිළිබඳව මියගිය අය සතු සියළුම අයිතිවාසිකම්වලට (කලින් කලට ව්‍යවස්ථාපිත අධිකාරීන් මගින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව) හිමිකම් කිව හැක.

04. තනි පුද්ගල ගිණුමක ගිණුම්කරුගේ මරණය සිදුවූ අවස්ථාවක සිවිල් නඩු විධාන සංග්‍රහයේ 544 වන වගන්තිය අනුව ඔහු හෝ ඇය විසින් නාමිතයකු නම්කර නොමැතිනම් මියගිය අයගේ නීත්‍යානුකූල උරුමකරුවන්ට ඔහුගේ/ඇයගේ අයිතීන් පිළිබඳ හිමිකම පැවරේ.

05. ස්ථිර තැන්පතු කුවිතාන්සිය අස්ථාන ගත වුවහොත් ඒ බව අප්‍රමාදව බැංකුවට ලිඛිතව දැනුම්දිය යුතුය.

06. තැන්පත්කරු/තැන්පත්කරුවන් පසු යම් අවස්ථාවක බදු ගෙවන්නෙකු/ගෙවන්නන් බවට පත්වුවහොත් එවැනි තොරතුරු ඉතා ඉක්මනින් බැංකුව වෙත සැපයිය යුතුය.

07. ඔබගේ තැපැල් ලිපිනය/විද්‍යුත් තැපැල් ලිපිනය වෙනස් වූ අවස්ථාවක ඒ බව නොපමාව අදාළ ශාඛාව වෙත දැනුම් දිය යුතුය.

08. ස්ථිර තැන්පතු ගිණුම විවෘත කළ පුද්ගලයා/පුද්ගලයන් විසින්ම ගිණුම වැසීම සිදු කළ යුතුය.

09. විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් මෙහෙයවීම, පාලනය කිරීමේ විනිමය පාලන රෙගුලාසි සහ නියමයන් කෙරෙහි අනුකූලතාවයකින් යුතුව කටයුතු කිරීමට හා ඒවායින් බැඳී සිටීමට ගණුදෙනුකරු එකඟ විය යුතුය.

## ඉලෙක්ට්‍රොනික සන්නිවේදන පිළිබඳ ප්‍රකාශය

01. මා/අප විසින් සිදු කරනු ලබන ඉලෙක්ට්‍රොනික බැංකු පහසුකම්වලට අදාළව ජනනය වන කෙටි පණිවිඩ, මාගේ/අපගේ ගිණුම් පිළිබඳ විද්‍යුත් ගිණුම් ප්‍රකාශය/ප්‍රකාශ සහ එක්වරක් පමණක් ජනනය වන රහස් අංක (OTPs) ලබාගැනීම සඳහා මාගේ/අපගේ ජංගම දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය පද්ධතිය තුල ලියාපදිංචි/යාවත්කාලීන කරන්න.

02. මම මෙම සිම්පත මගේ පෞද්ගලික ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන අතර, මගේ ජංගම දුරකථනයේ අංකය මෙම සිම්පතේ අංකයම වේ. අදාළ පහසුකම/පහසුකම්, සේවාවක්/සේවාවන් සැපයීම සඳහා භාවිතා කිරීම පිණිස මෙම අංකය මගේ ජංගම දුරකථන අංකය වශයෙන් ලියාපදිංචි කිරීමෙන් අනතුරුව, මෙම අංකය මගින් මහජන බැංකුව වෙතින් අන්තර්ජාල බැංකු පහසුකම්/ජංගම දුරකථන බැංකු පහසුකම් සහ වෙනත් කිසියම් පහසුකමක්/හෝ සේවාවක් මා වෙත සැලසීමෙන් පසුව හා එවැනි පහසුකමක්/පහසුකම්, සේවාවක්/සේවාවන් සැපයීම සඳහා මෙම ජංගම දුරකථන අංකය මගින් සිදුකරන ලද බැංකු ගනුදෙනු පිළිබඳව සම්පූර්ණ වගකීම මම භාරගනිමි.

03. ජංගම දුරකථන අංකයේ සහ විද්‍යුත් තැපැල් ලිපිනයේ යම්කිසි වෙනසක් සිදු වුවහොත් ඒ බව බැංකුව වෙත දැන්වීමට සහ මෙම සේවාව භාවිතා කිරීම සඳහා අදාළ වන නියමයන්ට සහ කොන්දේසිවලට මෙන්ම මෙම සේවාවන්ට අදාළව කලින් කලට පනවනු ලබන නියමයන් හා කොන්දේසිවලට යටත්ව කටයුතු කිරීමට මම/අපි එකඟ වෙමි/වෙමු. මෙම සේවාව භාවිතා කිරීමේදී මා/අප විසින් දෙනු ලබන විධාන ක්‍රියාත්මක කිරීමේදී යම් හිමිකම්පෑමක්, ආදේශයක්, හානියක්, අලාභයක්, ගාස්තුවක්, වියදමක් දැරීමට හෝ අගතියක් බැංකුවට සිදු වුවහොත් ඒ සියල්ල මා/අප විසින් හානි පූරණය කිරීමට එකඟ වෙමි/වෙමු.

04. මෙම ගිණුම් විවෘත කිරීමේ අයදුම්පතෙහි සඳහන් විද්‍යුත් සම්බන්ධතාවයන් පිළිබඳ විස්තර නවතම තොරතුරු ලෙස සැලකීමට හා ඒ අනුව පද්ධතිය යාවත්කාලීන කිරීමට බැංකුවට පූර්ණ හිමිකමක් ඇත.

05. මා/අප විසින් අධිවේග බැංකුකරණය හරහා ගිණුම/ගිණුම් විවෘත කිරීමේදී නිර්මාණය කර ගන්නා ලද පරිශීලක නාමය බැංකුව විසින් සපයනු ලබන අන්තර්ජාල/ජංගම දුරකථන පහසුකම් සඳහා ද යොදා ගැනීමට මම/අපි එකඟ වෙමි/වෙමු.

06. බැංකුව විසින් සපයනු ලබන කෙටි පණිවුඩ සේවා පහසුකම (SMS ALERTS) වෙනුවෙන් ගෙවීම් කිරීමට මම/අපි එකඟ වෙමි/වෙමු.

## "ඇමරිකානු පුද්ගලයා" යන අර්ථ නිරූපනයට යටත් පුද්ගලයින් විසින් කරනු ලබන ප්‍රකාශය (කරුණාකර අදාළ කොටුව තුළ ( ✓ ) ලකුණ යොදන්න)

☐ 01. (අ) විදේශ වත්කම් තුළින් එක්සත් ජනපද පුරවැසියන්, බදු ගෙවීම පැහැර හැරීම වැලැක්වීම සඳහා අරමුණු කරගත් එක්සත් ජනපද නීතිකරණයක් වන විදේශ ගිණුම් සඳහා බදු අයකිරීම් අනුකූලතා පනතේ ප්‍රතිපාදන යටතේ "ඇමරිකානු පුද්ගලයා" (U.S Person) යන්නෙහි නිර්වචනයට මම අයත් වෙමි.

(ආ) "විදේශ ගිණුම් සඳහා බදු අයකිරීම් අනුකූලතා පනත" රටෙන් බැහැර පිහිටි හා වලංගු වූවක් බවත්, එම පනත යටතේ "ඇමරිකානු පුද්ගලයන්" පිටරට පවත්වා ගෙන යන ඔවුන්ගේ මූල්‍ය වත්කම් විස්තර වාර්තා කිරීම අවශ්‍ය බවත් මා අවබෝධ කරගෙන ඇති බව මෙයින් සහතික කරමි.

(ඇ) එහෙයින්, ඇමරිකානු එක්සත් ජනපදයේ "අභ්‍යන්තර ආදායම් සේවා" (I.R.S) වෙත මා/අප විසින් පවත්වනු ලබන ගිණුම් සහ ආයෝජනයන්හි අදාළ සියළුම තොරතුරු වාර්තා කරන මෙන් "විදේශ ගිණුම් සඳහා බදු අය කිරීම් අනුකූලතා පනත" අනුව විදේශීය මූල්‍ය ආයතනයක් වශයෙන් පිළිගනු ලැබ ඇති මහජන බැංකුව වෙතින් මෙයින් මම ඉල්ලා සිටිමි.

(ඈ) ශ්‍රී ලංකාවේ 1988 අංක 30 දරණ බැංකු පනතේ 77 ජේදයේ ප්‍රතිපාදන අනුව, එකී ප්‍රතිපාදන පිළිබඳ පූර්ණ දැනුමකින් සහ අවබෝධයකින් යුතුව මා විසින් මෙම එකඟතාවය ලබා දී ඇති බව, මම තවදුරටත් සහතික කරමි.

☐ 02. විදේශ ගිණුම් සඳහා බදු අයකිරීම් අනුකූලතා පනතේ "ඇමරිකානු පුද්ගලයා" යන අර්ථ නිරූපනය යටතට මා නොගැනෙන අතර, අනාගතයේ දී මා ඇමරිකානු පුද්ගලයෙක් බවට පත් වුවහොත් බැංකුව වෙත දැනුම් දීමට මම මෙයින් එකඟ වෙමි.

ඉහතින් ලබාදී ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මම/අපි මෙයින් තහවුරු කරන අතර, ගිණුම/ගිණුම් පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් ඉහත සඳහන් කර ඇති කොන්දේසි සහ නියමයන් කෙරෙහිද, මෙම ගිණුම් මෙහෙයවන ආකාරය සම්බන්ධයෙන් මම/අප විසින් කර ඇති ප්‍රකාශ කෙරෙහිද අනුකූලතාවයකින් යුතුව කටයුතු කිරීමටත්, ඒවා මගින් බැඳී සිටීමටත් මම/අපි මෙයින් එකඟවෙමි/එකඟවෙමු.

අත්සන (අයදුම්කරු 1) දිනය අත්සන (අයදුම්කරු 2) දිනය

## නාම යෝජනා දැන්වීම (ඔබ නාමයෝජනා නොකරන්නේ නම් කරුණාකර මෙම කොටස කපා හරින්න.)

| ගිණුම් අංකය | ☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐ බල පැවැත්වෙන දිනය D D M M Y Y | ජා.හැ. අංකය/ රියදුරු බලපත්/විදේශ ගමන් බලපත් අංකය | හිමිකම් ප්‍රමාණය % |
|---|---|---|---|
| නාමිතයාගේ සම්පූර්ණ නම | 1. | | |
| | 2. | | |
| | 3. | | |
| නාමිතයාගේ ලිපිනය | 1. | | |
| | 2. | | |
| | 3. | | |

01. නාම යෝජක පාර්ශවයට අයත් අන්තිම කැමති පත්‍රයක/පත්‍රයන්හි මෙම නාම යෝජනාවට පටහැනි යමක් සඳහන් වූවද ඒවා නොතකා මෙම නාම යෝජනාව ක්‍රියාත්මක වනු ඇත.

02. ගිණුම්කරුගේ අභිමතය පරිදි නාමිතයා, ජීවත්වන කලත්‍රයා/දරුවෙකු/නෑදෑයෙකු හෝ වෙනත් අයෙකු විය හැකිය.

03. පහත සඳහන් හේතූන් මත මෙම නාම යෝජනාව අවලංගු වනු ඇත.
   i. නාමයෝජකගේ/තැන්පත්කරුගේ ජීවිත කාලය තුළ නාමිතයා/නාමිතයින් මියයෑම.
   ii. නාමයෝජක විසින් අත්සනට සාක්ෂි දැරිය හැකි, සාක්ෂිකරුවෙකු ඉදිරියේ දී අත්සන් කළ ලිඛිත අවලංගු කිරීමේ දැන්වීමක් බැංකුව වෙත ඉදිරිපත් කිරීම.
   iii. නාම යෝජක විසින් මෙම ගිණුමට/ගිණුම්වලට වෙනත් නාම යෝජනාවක් කර බැංකුව වෙත ඉදිරිපත් කිරීම.

04. නාමිතයා විසින් බැංකුව සෑහීමකට පත්වන පරිදි අනන්‍යතාවය පිළිබඳ තහවුරුවක් ඉදිරිපත් කළ පසු ගෙවීම් කිරීම කළ හැකිය.

05. නාමිතයන් එක් අයෙකුට වඩා නම් කොට ඇති අවස්ථාවලදී ශේෂයෙන් වෙන් කරනු ලැබූ ප්‍රතිශතය සඳහන් කර නොමැති විට ගිණුමේ/ගිණුම්වල බැරට ඇති මුදල් නාමිතයන් අතර සම කොටස් වලින් ගෙවනු ලැබිය යුතුය.

06. උසාවි නියෝග, දේපල තහනම් කිරීම සහ දේශීය ආදායම් නියෝග තරයේ පිළිපැදිය යුතුය.

07. නාම යෝජනා දැන්වීමක සහ ලිඛිත අවලංගු කිරීමේ ඉල්ලීමක නාම යෝජක පාර්ශවයේ අත්සනට හැකි සෑම අවස්ථාවකදීම සාක්ෂි දැරිය යුත්තේ බැංකු නිලධාරී විසිනි. එසේ නොවන අවස්ථාවලදී සාමවිනිසුරුවරයෙකු/නීතිඥවරයෙකු/සුදුසුකම්ලත් වෛද්‍ය වෘත්තිකයෙකු හෝ රජයේ/සංස්ථා මාණ්ඩලික නිලධාරියෙකුට නාම යෝජක පාර්ශවයේ අත්සනට සාක්ෂි දැරිය හැකිය.

08. ජංගම ගිණුමක නොවන ඕනෑම ගිණුමක මුදල් හිමි අවු. 16 ට වැඩි ඕනෑම පුද්ගලයෙකුට එම පුද්ගලයාගේ මරණයෙන් පසු එම මුදල් ගෙවනු ලැබිය යුතු තැනැත්තෙකුගේ නම යෝජනා කළ හැකිය.

09. බෞද්ධ භික්ෂූන් වහන්සේ නමකට නාමිතයෙකු නාමනය කළ නොහැක.

10. බද්ධ ගිණුම්වලට අදාළ නාමනය ක්‍රියාත්මක කළ හැකි වන්නේ සියළුම බද්ධ ගිණුම් හිමියන් එකවර මියගිය හොත් පමණක් වන අතර එක් ගිණුම් හිමියෙකු මියගියහොත් නාමයෝජනාව නොසලකා ජීවත්ව සිටින ගිණුම් හිමිට/හිමියන්ට ගිණුමේ / ගිණුම්වල සම්පූර්ණ මුදල් හිමිවනු ඇත.

මගේ/අපගේ මරණයේදී ගිණුමේ ඇති සියලුම මුදල් ලැබීමට මම/අපි මෙයින් ඉහත නම් කර ඇති මගේ/අපේ නම් කරන ලද අය ලෙස මෙයින් නාමයෝජනා කරමු.

| | |
|---|---|
| නාමයෝජක පාර්ශවයේ අත්සන<br>දිනය | නාමයෝජකයාගේ අනන්‍යතාවය සහ අත්සන පිළිබඳ සාක්ෂිකරුවන් :<br><br>බැංකු නිලධාරී/සාක්ෂිකරුගේ අත්සන |
| අනුක්‍රමික අංකය<br>පොත් අංක 55 අනුව | බැංකු නිලධාරී/සාක්ෂිකරුගේ නම, ලිපිනය සහ නිල මුද්‍රාව<br>• *නාම යෝජනා දැන්වීමෙහි සහතික කල පිටපතක් නාම යෝජක පාර්ශවය වෙත භාරදිය යුතුය.* |

ඉහත නාම යෝජනාව පසුකාලීනව වෙනස් කිරීමට ඔබට අවශ්‍ය වන්නේ නම් ආ.ප. අංක 1510 පුරවා ගිණුම පවත්වාගෙන යන ශාඛාවට භාර දෙන්න.